# <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

## <u>ශ්‍රී ලංකා නාවික හමුදාව</u>

### **<u>2023 වර්ෂයේ අගෝස්තු මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවට පොදු ගබඩා ද්‍රව්‍ය සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ ආනයන කරුවන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම</u>**

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත 2023 අගෝස්තු මස 01 වන දින සිට 2023 දෙසැම්බර් මස 31 වන දින දක්වා පහත දක්වා ඇති වෙන් වෙන් මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකයන් වලට අයත් පොදු ගබඩා ද්‍රව්‍යයන් සඳහා එක් මිල කැඳවුමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ ඉදිරිපත් හැකි නිෂ්පාදකයන්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන් වල වලංගු කාලය 2023 අගෝස්තු මස 01 වන දින සිට 2023 දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතුයි.

   අ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන ගබඩා ද්‍රව්‍යයන් මාර්ගස්ථ ගබඩාව ශ්‍රීලංනානෞ “මහසෙන්” වැලිසර, රාගම වෙත සැපයුම් කල යුතුය.

   ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා එක් එක් කාණ්ඩයන් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 5000.00 ක අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙත ඉදිරිපත් කර අයදුම්පත් 2023 අප්‍රේල් මස 24 වන දින සිට 2023 මැයි මස 16 වන දින දක්වා සතියේ වැඩකරන දින 1000 පැයේ සිට 1400 පැය දක්වා ලබා ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති දිනයන්ට ප්‍රථම ඉදිරිපත් කල යුතුය.

2. 2023 වර්ෂය සඳහා අවශ්‍ය පොදු ගබඩා ද්‍රව්‍යයන් වල විස්තර සහ දළ අවශ්‍යතා ප්‍රමාණයන් එක් එක් මිල ගණන් කැඳවුම් අනුව අයදුම්පත් සමඟ නිකුත් කරනු ලැබේ.

<u>විෂයය කාණ්ඩයන් සහ අංකයන්</u>

| <u>මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකයන්</u> | <u>විෂයය කාණ්ඩ විස්තරය</u> | <u>මිල ගණන් කැඳවීම අවසන් වන දිනය හා විවෘත කරන වේලාව</u> |
|---|---|---|
| එස්එල්එන්/එල්ඕජී/01/ආර්සී/2023 | සියළුම බැටරි වර්ග | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/02/ආර්සී/2023 | එතුම් කම්බි | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/03/ආර්සී/2023 | ගෘහස්ථ විදුලි රැහැන් | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/04/ආර්සී/2023 | ස්විච, එම්සීබී, එම්සීසීබී, ආර්සීසීබී | 2023 මැයි 17, 1000 පැය |

| | | |
|---|---|---|
| එස්එල්එන්/එල්ඕජී/05/ආර්සී/2023 | නාන කාමර කට්ටල | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/08/ආර්සී/2023 | කන්ඩියුට් සහ උපාංග | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/10/ආර්සී/2023 | කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා වායු වර්ග | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2023 (ලිපිගොනු අංක. 01) | ගොඩනැගිලි ඉදිකිරිමේ කටයුතු සඳහා යොදා ගන්නා විෂයයන් - මෘදු වානේ සහ ගැල්වනයිස් කරන ලද අයිතම | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2023 (ලිපිගොනු අංක. 02) | ගොඩනැගිලි ඉදිකිරිමේ කටයුතු සඳහා යොදා ගන්නා විෂයයන් - දොර කවුළු සඳහා භාවිතා කරන අයිතමයන් සහ උපාංග | 2023 මැයි 17, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/11/ආර්සී/2023 (ලිපිගොනු අංක. 03) | ගොඩනැගිලි ඉදිකිරිමේ කටයුතු සඳහා යොදා ගන්නා පොදු විෂයයන් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/12/ආර්සී/2023 | පිරිසිදු කිරිමේ කටයුතු සඳහා යොදා ගන්නා සනීපාරක්ෂක අයිතමයන් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/13/ආර්සී/2023 | දුරකථන රැහැන් වර්ග (ගෘහස්ථ) ඩ්‍රොප් වයර් සහ දුරකථන උපකරණ. | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/14/ආර්සී/2023 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/15/ආර්සී/2023 | මුද්‍රණ කඩදාසි හා පොත් පත් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/16/ආර්සී/2023 | දේශීය ලී වර්ග | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2023 (ලිපිගොනු අංක. 01) | පොදු ඉංජිනේරු විෂයයන් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2023 (ලිපිගොනු අංක. 02) | පොදු ඉංජිනේරු විෂයයන් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/17/ආර්සී/2023 (ලිපිගොනු අංක. 03) | පොදු ඉංජිනේරු විෂයයන් | 2023 මැයි 18, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/18/ආර්සී/2023 | පැස්සුම් කූරු | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/19/ආර්සී/2023 | පීවීසී ජල නල සහ උපාංග | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/20/ආර්සී/2023 | තුනී ලෑලි (දේශීය සහ විදේශීය) | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/21/ආර්සී/2023 | පොදු තීන්ත වර්ග | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/24/ආර්සී/2023 | විදුලි බුබුලු වර්ග | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/26/ආර්සී/2023 | මෝටර් රථ තීන්ත | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/27/ආර්සී/2023 | මුද්‍රණ කටයුතු සඳහා යොදාගන්නා අයිතමයන් | 2023 මැයි 19, 1000 පැය |
| එස්එල්එන්/එල්ඕජී/29/ආර්සී/2023 | සවිගන්වන ලද වීදුරු කෙඳි (*GRP*) | 2023 මැයි 19, 1000 පැය |

3. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ)

- අ. පොදු ගබඩා ද්‍රව්‍යයන් සමාන ධාරිතා බලයක් සහිතව රජයේ / පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02ක සතුටුදායක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්තා.
- ආ. ස්ථිර මූල්‍යමය හැකියාව.
- ඇ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක වාර්තා.
- ඈ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, විද්‍යුත් ලිපින)
- ඉ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.
- ඊ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.
- උ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.
- ඌ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03ක කාලය තුල අඛණ්ඩව ව්‍යාපාර කටයුතු වල යෙදී සිටි බවට වාර්ථා ඉදිරිපත් කල යුතුය.

4. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරිමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5**. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ "ශ්‍රී ලංකා නාවික හමුදාවට 2023 වර්ෂය සඳහා පොදු ගබඩා විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිළ ගණන් ඉදිරිපත් කිරිම" (විෂයය කාණ්ඩය) එස්එල්එන්/එල්ඕජී/......./ආර්සී/2023 ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ඒකක කොන්ත්‍රාත් ටෙන්ඩර් බහාළුම් පෙට්ටියේ තැම්පත් කිරීමට කටයුතු කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා නාවික හමුදාව,
නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ 593,
කොළඹ 01.

**6.** මිල ගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

**7**. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, නිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල

ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

8. තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ශිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

9. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව මාණ්ඩලික නිළධාරි (ඒකක කොන්ත්‍රාත්), නාවික හමුදා මුලස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ පරීක්‍ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර මාණ්ඩලික නිලධාරී (ඒකක කොන්ත්‍රාත්) දු.ක. 011 7712326, නාවික හමුදා මුලස්ථානය, කොළඹ 01 වෙතින් ලබා ගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk මඟින් ද ලබා ගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා නාවික හමුදාව
කොළඹ 01